**ශ්‍රී ලංකාව තුළ බීජ හා රෝපන ද්‍රව්‍ය පරිහරණයකරන්නකු ලෙස 2003 අංක 22 දරණ බීජ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍රය පිරවීම සඳහා උපදෙස් පත්‍රිකාවයි. අයදුම්පතෙහි සඳහන් අනු අංක අනුව මෙහි සපයා ඇති උපදෙස් පරිදි අයදුම්පත්‍රය පිරවීමට කටයුතු කරන්න.**

***<u>වැදගත්</u>***

A. මෙම අයදුම්පත්‍රය හා උපදෙස් පත්‍රිකාව නොමිලේ නිකුත් කෙරේ.

B. මෙහි බීජ පරිහරණයකරන්නෙක් ලෙස බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදකයෙක්, ආනයනයකරන්නෙක්, ගබඩා කරන්නෙක්, සකසන්නෙක්, නැවත හසුරන්නෙක්, බෙදාහරින්නෙක්, තොග හා සිල්ලර අලෙවිකරුවෙක් අදහස් කෙරේ.

C. අයදුම්පත්‍රයෙහි අංක 1 සිට 25 දක්වා අයදුම්කරු විසින් පිරවිය යුතුයි.

| **අයදුම්පතෙහි අනු අංකය** | **උපදෙස්** |
|---|---|
| 1. | ඔබ මීට පෙර බීජ පනතේ ලියාපදිංචි වී ඇත්නම් ඔව් ☑ ද, නොමැතිනම් නැත ☑ ද යොදන්න. ඔව් නම් දිනය (DD), මාසය (MM) , වර්ෂය (YYYY) අදාළ කොටුව තුළ ලියාපදිංචි වූ දිනය සඳහන් කර, ලියාපදිංචි අංකය නියමිත කොටුවේ සඳහන් කරන්න. |
| 2. | අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහලෙන්ද, මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්ද පැහැදිලිව ලියන්න. |
| 3. | බීජ පනතට අනුව ලියාපදිංචිය ඉල්ලුම් කරන කාර්යය සිදු කරන පෞද්ගලික , රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයේ නම ලියන්න. එම නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්ද ලියන්න. |
| 4. | ආයතනය තුළ අයදුම්කරුගේ තනතුර සඳහන් කරන්න. |
| 5. | අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය නියමිත කොටුව තුළ එක අංකය බැගින් සඳහන් කරන්න.<br>ව්‍යාපාරය දැනට වෙළඳ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර ඇත්නම් එහි අංකය සඳහන් කරන්න. |
| 6. | 6.1) ව්‍යාපාරය පිහිටා ඇති දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහන් කරන්න.<br>6.2) එම ස්ථානයේ දුරකථන අංකය, ලිපිනය, E-mail ලිපිනය සඳහන් කරන්න.<br>6.3) අයදුම්කරුගේ පෞද්ගලික ලිපිනය, දුරකථන අංකය, ජංගම හා ස්ථාවර අංක මෙහි සඳහන් කරන්න. |
| 7. | අයදුම්කරු සඳහන් කරන ව්‍යාපාර ආයතනයට සම්බන්ධව වෙනත් ස්ථානවල ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම්, එම ස්ථානවල ව්‍යාපාර නාමයන් සහිත ලිපිනයන් සඳහන් කරන්න. මෙම ස්ථාන බීජ පනත අනුව වෙන වෙනම ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. |
| 8. | ව්‍යාපාරයේ, නිෂ්පාදනවල වෙළඳ නාමය මෙහි සඳහන් කරන්න. |
| 9. | බීජ පනතේ ලියාපදිංචි වීමට අවශ්‍ය ප්‍රධාන කාර්යය (එක් කාර්යයක් පමණක්) සඳහා මෙහි ඇති ☑ ලකුණ යොදන්න. |
| 10. | ඉහත 9 හි ඔබ සඳහන් කළ කාර්යයට අමතරව එහි සඳහන් අනෙකුත් කාර්යයන් වල ඔබ නිරත වන්නේ නම් ඔව් ☑ යන්නද එම කාර්යයන් වල නිරත නොවන්නේ නම් නැත ☑ යන්නද සඳහන් කරන්න.<br>10.1) ඔව් නම් 10.1 හි 1. ................ , 2. ................ , 3. ................ හි අනුපිළිවෙලින් එම කාර්යයන් සඳහන් කරන්න. |
| 11. | ඉහත 9 හා10.1 හි සඳහන් කළ ඔබගේ කාරයයන් වලට අදාළව 11.1 සිට 11.4 දක්වා සඳහන් කර ඇති බෝග කාණ්ඩ වලට පමණක් ☑ ලකුණ යොදන්න. |
| 12. | ඉහත 9 හා 10.1 හි සඳහන් කාර්යයන් වලට අදාළව 12.1 සිට 12.8 දක්වා අසා ඇති තොරතුරු වලට විස්තර නිවැරදිව සඳහන් කරන්න. |

13. ලියාපදිංචිය වලංගු වර්ෂ 02 ක කාලය තුළදී වී, එළවළු, අතිරේක ආහාර බෝග, අර්තාපල්, බිම්මල් බීජ වල නිෂ්පාදන ඉලක්ක හා ආනයනික බීජ හා රෝපන ද්‍රව්‍ය වල ආනයනික ඉලක්ක එහි දක්වා ඇති ඒකක වලින් සඳහන් කරන්න.

14. **බද්ධ පළතුරු පැල නිෂ්පාදනය** - මව් ශාක පිළිබඳ විස්තර අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.
14.i) සිට 14.v) දක්වා සඳහන් කර ඇති එක් එක් බෝග කාණ්ඩ සඳහා නිෂ්පාදන ඉලක්ක තොරතුරු සඳහන් කරන්න.

15. **අපනයන බෝග නිෂ්පාදනය** - නිෂ්පාදන ඉලක්ක පිළිබඳ තොරතුරු අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.

16. **තේ පැල නිෂ්පාදනය** - නිෂ්පාදන ඉලක්ක පිළිබඳ තොරතුරු අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.

17. **පොල් පැල නිෂ්පාදනය** - නිෂ්පාදන ඉලක්ක පිළිබඳ තොරතුරු අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.

18. **බද්ධ රබර් පැල නිෂ්පාදනය** - නිෂ්පාදන ඉලක්ක පිළිබඳ තොරතුරු අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.

19. **ඉහත සඳහන් කර නොමැති** වෙනත් පැල වර්ග ඔබ නිෂ්පාදනය කරන්නේ නම් එම නිෂ්පාදන ඉලක්ක පිළිබඳ තොරතුරු අදාළ කොටු තුළ නිවැරදිව සඳහන් කරන්න.

20. බීජ අලෙවි කටයුතු පිළිබඳ තොරතුරු සැපයීම.
   i) දේශීය බීජ අලෙවි ඉලක්ක පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.
   ii) විදේශීය බීජ අලෙවි ඉලක්ක සඳහන් කරන්න.
   iii) අර්තාපල් බීජ ඉලක්ක සඳහන් කරන්න.
   iv) රෝපන ද්‍රව්‍ය (පැල) ඉලක්ක සඳහන් කරන්න.

21. බීජ පනත යටතේ ඔබ වරදකරුවකු ලෙස දඬුවම් ලබා ඇතිනම් හෝ අවවාද කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

22. අයදුම්පත නිවැරදිව පුරවා ඇති බවට හා බීජ පනතට අනුකූලව ඉහත කාර්යයන් වල යෙදෙන බවට සඳහන් ප්‍රකාශයේ දිනය හා අයදුම්කරුගේ අත්සන යොදන්න.

23. ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක හා එම බල ප්‍රදේශයේ බීජ සහතික කිරීමේ සේවයේ ස්ථාන භාර නිළධාරී සමඟ ඒකාබද්ධව මෙම බීජ හසුරුවන්නන්ගේ කාර්යය කරන ස්ථානය පරීක්ෂා කොට නිර්දේශය ලබාදීම සඳහා අදාළ විස්තර ඔවුන් විසින් සැපයීම කළ යුතුය. මෙහිදී අදාළ නිළධාරීන්ගේ නම සහිත නිළ මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.

24. දේශීය හා විදේශීය බීජ ඇසුරුම්කරන්නන් හා පැල නිෂ්පාදකයින් සඳහා අදාළ වේ.
   i) ඉහත බීජ ඇසුරුම්කරන්නන් විසින් ඇසුරුම් කිරීමට බලාපොරොත්තු වන හා පැල නිෂ්පාදකයින් විසින් භාවිතා කිරීමට බලාපොරොත්තු වන, බීජ පනතට අනුකූලව සකස් කරන ලද ඇසුරුම් හා ලේබල් වල වර්ණ පිටපත් (මුද්‍රණය කිරීමට පෙර) අනුමැතිය සඳහා බීජ පනත ක්‍රියාත්මක කිරීමේ ඒකකයට එවිය යුතුවේ. එම නිසා ඔබ එවන එම ඇසුරුම් හා ලේබල් 1 , 2 . 3 , 4. ..... ලෙස අනුපිළිවෙලට සඳහන් කර, ස්ථාන භාර නිළධාරී (බී.ස.සේ.) වෙත භාරදෙන්න.
   ii) මෙම ඇසුරුම් හා ලේබල් බීජ පනතට අනුකූලව සැකසීම සඳහා අවශ්‍ය උපදෙස් ස්ථාන භාර නිළධාරී (බී.ස.සේ.) ගෙන් ලබාගන්න.

25. ලියාපදිංචි ගාස්තු ගෙවීම.
අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු ඔබගේ පරිශ්‍රය පරීක්ෂා කර ලියාපදිංචි කිරීම සුදුසු බවට නිර්දේශ කිරීමෙන් පසු , ලියාපදිංචි ගාස්තු ගෙවීම සඳහා උපදෙස් ලබාදෙනු ඇත. ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් කොන්දේසිවල ඇතුළත්ය.

## බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණයකරන්නන් සඳහා කොන්දේසි

1. ලියාපදිංචි කිරීම සඳහා අයකරන ගාස්තු
(අංක 23 හි සඳහන් පරිදි එහි සඳහන් මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ලියාපදිංචිවීම සඳහා මුදල් බැඳීම සිදු කළ හැක. කරනු ලබන කාර්යය අනුව පහත සඳහන් පරිදි ලියාපදිංචි ගාස්තු අයකරනු ලැබේ.)
    (I) බීජ/රෝපණ ද්‍රව්‍ය ආනයනය : රු. 2500.00
    (II) බීජ/රෝපණ ද්‍රව්‍ය පිළිබඳ දේශීය කටයුතු : රු. 1000.00
    (III) ඉහත දෙයාකාරයටම : රු. 3500.00

2. දේශිය බීජ නිෂ්පාදකයින් බීජ නිෂ්පාදනයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මඟින් සහතික කළ මුලික බීජ භාවිතා කළ යුතුය.

3. දේශීය බීජ නිෂ්පාදනය සඳහා ආනයනය කල මුලික බීජ භාවිතා කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ ලිඛිත අනුමැතිය ලබා තිබිය යුතුය.

4. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අදාළ ආයතන සතුව ලියාපදිංචි කල මව්ශාක/ මව්ශාක ක්ෂේත්‍ර/කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ ලිඛිත අනුමැතියක් සහිතව විධිමත් ක්‍රමවේදයන් යටතේ ආනයනය කළ රෝපණ ද්‍රව්‍ය තිබිය යුතුය.

5. අලෙවිය සඳහා ඉදිරිපත් කරන බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතික ලේබලයක් හෝ බීජ පනතේ රෙගුලාසිවලට අනුකුල වූද බීජ පනත ක්‍රියාත්මක කිරීමේ කාර්යාලයෙන් අනුමැතියලත් ලේබල් හා ඇසුරුම් පමණක් භාවිතා කළ යුතුය.

6. බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණයකරන්නෙකු ලෙස කටයුතු කිරීම සඳහා බීජ පනත සහ එහි රෙගුලාසිවලට අනුකුලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

7. මෙම ලියාපදිංචිය වසර 2 කට පමණක් වලංගු වන අතර අවලංගු වන දිනට මසකට පෙර ලියාපදිංචිය දීර්ඝ කරගැනීමට නැවත ඉල්ලුම් කළ යුතුය.

8. අයදුම්පත්‍රය පිරවීම සඳහා අවශ්‍ය උපදෙස් මේ සමඟ අමුණා ඇත. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ඔබ ප්‍රදේශයේ බීජ සහතික කිරීමේ ප්‍රාදේශීය කාර්යාලයෙන් හෝ පේරාදෙණිය, ගන්නෝරුව බිජ සහතික කිරීමේ සේවයේ බීජ පනත ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙන් විමසන්න.
දුරකථන අංක : බීජ සහතික කිරීමේ සේවය - 081-2388217
බීජ පනත ක්‍රියාත්මක කිරීමේ ඒකකය - 081-3755235

9. ඔබ වෙත නිකුත් කරන බලපත්‍රය ඕනෑම අයකුට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි පරිදි ප්‍රදර්ශනය කළ යුතුය.

10. විශේෂයෙන් බීජ හෝ පැල අලෙවිකරන්නන් අලෙවි ස්ථානයේ යොදන නාම පුවරුවේ, පනතේ ලියාපදිංචි අංකය පැහැදිලිව පෙනෙන සේ ඇතුළත් කළ යුතුය.